මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2021-11-29

පෙත්සම්කරු : එස්. ඒ. සි. එස්. ගුණරත්න මයා.
5/2 බී. පන්සල පාර.
මරදාන.
කොළඹ 10.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පති.
ආනන්ද විද්‍යාලය.
කොළඹ 10.

02. අධ්‍යක්ෂ (ප්‍රාථමික අංශය).
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය.
බත්තරමුල්ල.

**පැමිණිලි අංකය : HRC/112/20**

**පැමිණිල්ල :-**

ඉහත කී පෙත්සම්කරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ 2020-01-09 වන දින මෙම පැමිණිල්ල ඉදිරිපත් කරමින් කියා සිටින්නේ ඔහුගේ දරුවා වන එස්. ඒ. වි. එම්. ගුණරත්න කොළඹ ආනන්ද විද්‍යාලයේ 2020 වසරේ පළමු වසරට ඇතුළත් කිරීම සඳහා අයදුම් කරන ලදුව 2019.08.28 වන දින ගෘහ මූලික පදනම CO 438 අංකය යටතේ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටි බවත්ය. එම ගණය යටතේ ළමුන් ඇතුළත් කිරීමේදී ආනන්ද විද්‍යාල විසින් ලබා දුන් අවම



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ලකුණු වූයේ 75 බවත්, ඔහුගේ දරුවාට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු 74ක් ලබා දී තිබූ බවත්, ඔහු විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද බදු ඔප්පුවට හිමිවිය යුතු ලකුණු ලබා නොදීම තුළ අවම ලකුණු ප්‍රමාණයට ලඟා වීමට නොහැකි බවත්, ඔහුට හිමිවිය යුතු සම්පූර්ණ ලකුණු 08න් ලකුණු 06ක් අසාධාරණ ලෙස සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අහිමි කල බවත් පවසා සිටියි.

තවද පෙත්සම්කරු පවසා සිටින්නේ ඔහු සහ ඔහුගේ පවුලේ අය කොළඹ 10, මරදාන, පන්සල පාර, අංක 5/2 බී යන ස්ථානයේ පිහිටි නිවස වර්ෂ 05ක සිට බදු ගිවිසුම මත බද්දට ලබාගෙන පදිංචිව සිටින අතර, පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛණය ලෙස වර්ෂ 05ට අඩු 04කට වැඩි බදු ඔප්පුව සඳහා චක්‍රලේඛ අංක 29/2019 ප්‍රකාරව ලබාදිය යුතු ලකුණු ප්‍රමාණය වන ලකුණු 08 හිමිවිය යුතු අතර, ඔහු විසින් ඉදිරිපත් කරන ලද බදු ඔප්පුව සඳහා ලකුණු 02ක් පමණක් ලබා දී ඇති බවයි.

තවද, මෙම ගැටළුවට හේතු සහගත වී ඇත්තේ පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද අංක 775 දරණ දෙවන බදු ගිවිසුම සකස් කල නීතිඥවරයා එම ගිවිසුමට අත්සන් තබා ඇත්තේ ගිවිසුමෙහි සඳහන් දින සිට දින 20කට පසු බැවින්, එය අඛණ්ඩ ලියාපදිංචි වූවා සේ සැලකීමට නොහැකි බව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රකාශ කිරීම තුළය. එහෙත් පෙත්සම්කරු තවදුරටත් පවසා සිටින්නේ වර්ෂ 05කට වැඩි කාලයක් සිට අඛණ්ඩව බදු ඔප්පුවක් යටතේ ගිවිසුම් ගතව ඉහත ස්ථානයේ භුක්තිය විඳිනු ලබන බැවින්, නීතිඥවරයා අත්සන් තබන දිනය හේතු කර ගෙන වලංගු ගිවිසුමක අඛණ්ඩතාවයට බලපෑමක් සිදු නොවන බවය. ඒ අනුව එම නීතිඥවරයා විසින් ඉහත කී අංක දරණ ඔප්පු නීතිය ඉදිරියේ අඛණ්ඩව ලියාපදිංචි වූ බදු ඔප්පුවක් බවට සැලකෙන බව දක්වමින් අභියාචනා මණ්ඩලයේ සභාපති වෙත ලිපියක් ද ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම පිළිබඳව පරීක්ෂණය කිරීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තීරණය කර එකී පරීක්ෂණය සඳහා 2020.03.05 වන දින කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසට ඉහත කී පාර්ශවකරුවන්ට සිතාසි මගින් දැනුම් දී ඇතත්, පෙත්සම්කාර පාර්ශවය පමණක් එදින කොමිෂන් සභාව හමුවේ පෙනී සිටි අතර, නැවත 2020.09.17 වන දින පෙනී සිටින ලෙස පාර්ශවකරුවන්ට සිතාසි මගින් දැනුවත් කර ඇති අතර, පෙත්සම්කරු සහ වගඋත්තරකාර පාසල වෙනුවෙන් නියෝජ්‍ය විදුහල්පති වන පී. ඒ. ආර්. එල්. පෙරේරා මහතා පෙනී සිටියි.

පරීක්ෂණයේදී පෙත්සම්කරු තවදුරටත් පවසා සිටියේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඔහුගේ බදු ඔප්පුව සම්බන්ධව ගන්නා වූ තීරණය නැවත වතාවක් සලකා බලන ලෙස අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කලද එකී අභියාචනා පරීක්ෂණය 2019.12.17 වන දින පැවැත් වූ අතර, අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින් ඔහුගේ අහිමි කල ලකුණු 06 ලබා දී මුළු ලකුණු ප්‍රමාණය 80ක් බවට අත්සන් තබා ලකුණු සටහන ඔහුට ලබා දුන් බවයි. එකී ලකුණු සටහන ඇමුණුම III ලෙස නම් කර මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

තවද, මෙම අභියාචනා පරීක්ෂණයෙන් දින 09කට පසු එනම් 2019.12.26 පෙත්සම්කරුට නැවත වතාවක් 2019-12-27 වන දින පාසලට පැමිණෙන ලෙස දුරකථනය මගින් දැනුම් දී තිබූ අතර, එකී දැනුම්දීම ප්‍රකාරව පෙත්සම්කරු සහ ඔහුගේ බිරිඳ සහභාගි වූ බවත්, එහිදී අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු 80ක් පමණ සඳහන් කර ලබා දුන් ලකුණු සටහන නැවත වතාවක් සංශෝධනය කර " **අඛණ්ඩ ලියාපදිංචිය තහවුරු කර ගැනීමෙන් අනතුරුව ලකුණු 80ක් ප්‍රධානය කළ නොහැකි බව පෙර ලකුණු 74ක් පමණක් අයදුම්කරු ලබා ගත්තා ලද ලකුණු බවද සඳහන් කරමි.** " යනුවෙන් සටහන් කර නැවතත් පෙත්සම්කරුට ලබා දී ඇත. එකී ලකුණු සටහන ඇමුණුම IV ලෙස කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පරීක්ෂණය සඳහා පෙනී සිටි කොළඹ ආනන්ද විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිවරයා 2020 පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් ලෙසත්, CO 438 එස්. ඒ. සී. එස්. ගුණරත්න යන අයගේ දරුවා වන සුහසිංහ ආරච්චිලාගේ නෙතුක මිහිසර ගුණරත්න දරුවගේ ලිපිගොනුව තුළ අංක 598 සහ අංක 775 දරණ දින 20ක් පෙරදාතම් කාලයක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ බදු ඔප්පු සහ ලියාපදිංචි ලේඛණ පිළිබඳව උපදෙස් දෙන නිත්‍යමණ්ඩලය හඳුනාගත් නිසා අදාල බදු ඔප්පුව ඛණ්ඩනය වී ඇති බැවින්, එම බදු ඔප්පු වලට අදාල ලකුණු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රධානය කර ඇති බවත්ය. එබැවින්, පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද බදු ඔප්පුවට නියමිත ලකුණු ලබා දීමේදී පෙත්සම්කරුට අසාධාරණයක් සිදු වී නොමැති බවට පවසා සිටියි.

**කොමිෂන් සභාවේ නිරීක්ෂණ :-**

ඉහත කී පැමිණිල්ල පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණය සිදු කිරීමෙන් අනතුරුව මෙම පෙත්සමේ පෙත්සම්කරු විසින් මතුකරන ගැටළුව පිළිබඳ එනම්, බදු ඔප්පුවක් කාලය ආරම්භ වන්නේ බදු ඔප්පුවේ සඳහන් දිනයේ දී ද නැතහොත් එම බදු ඔප්පුව ලියූ නොතාරිස්වරයා අත්සන් කරන ලද දිනය ද යන්න ගැටළුවක් මතු වේ.

චක්‍රලේඛය ප්‍රකාරව අවුරුදු 05කට අඩු අවුරුදු 04කට වැඩි අඛණ්ඩ බදු ඔප්පුවකට ලබා දිය යුත්තේ ලකුණු 08ක් වුවද, මෙම පෙත්සම්කරුට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇත්තේ ලකුණු 02ක් පමණි. එයට හේතු වී ඇත්තේ පෙත්සම්කරු විසින් බදු ඔප්පු 02ක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සහ අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර, අංක 598 දරණ බදු ඔප්පුවේ සඳහන් පරිදි එකී බදු කාල සීමාව වර්ෂ 2014.11.01 වන දින සිට වර්ෂ 03ක් බව සඳහන් වන අතර, පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද 775 අංක දරණ දෙවන බදු ඔප්පුවද ආරම්භ වන්නේ වර්ෂ 2017ක් වූ නොවැම්බර් මස 01 වන දින සිට වර්ෂ 03ක් සඳහා බව පැහැදිලිව සඳහන් කර ඇත.

එනම් වර්ෂ 2020 නොවැම්බර් මස 01 දින සිට අඛණ්ඩ වර්ෂ 06ක කාල සීමාවක් ඇතුලත් කර ඇත. කෙසේ වෙතත් දෙවැනි බදු ඔප්පුව වන අංක 775 දරණ බදු ඔප්පුවේ එකී බදු ඔප්පුව සැකසූ ප්‍රසිද්ධ නොතාරිස්වරයා ඔහුගේ අත්සන තබා ඇත්තේ වර්ෂ 2017 ක් වූ නොවැම්බර් මස 20 වෙනි දිනයේය. එනම් එකී බදු ඔප්පුවේ සඳහන් බදු කාල සීමාව පටන් ගන්නා වූ දිනයේ සිට දින 19කට පසුවය.

මෙම අවස්ථාවේදී මානව හිමිකම කොමිසන් සභාව විසින් බදු ඔප්පුව නීත්‍යාණුකූල ආරම්භ වන දිනය එම බදු ඔප්පුවේ සඳහන් වූ දිනය ද නැතිනම් බදු ඔප්පුව සකස් කරන ලද නොතාරිස්වරයා විසින් අත්සන් කරන ලද දිනය ද යන්න ගැටළුවක් පැන නගියි.

වගඋත්තරකාර පාර්ශවය විසින් අභියාචනා පරීක්ෂණයේදී සලකා බලා ඇත්තේ බදු ඔප්පුවේ නොතාරිස්වරයා විසින් අත්සන් කරන ලද දිනය මෙකී බදු ඔප්පුවේ කාල සීමාව පටන් ගන්නා දිනය බවත්, පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද බදු ඔප්පු දෙක අතර, දින 19ක වෙනසක් තිබෙන බවත්, බදු ඔප්පුව ඛණ්ඩනය වී ඇති බවත්, චක්‍රලේඛය ප්‍රකාරව අඛණ්ඩ අවුරුදු 04 හෝ ඊට වැඩි යන සඳහා ලබාදිය යුතු මුළු ලකුණු ප්‍රමාණය ලබා දීමට නොහැකි බවද, පෙත්සම්කරුට ලකුණු 02ක් ලබා දී තිබෙන බවට නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත් අධ්‍යාපන අමාත්‍යාංශයේ 29/2019 චක්‍රලේඛනයේ බදු ඔප්පුව ලියාපදිංචි අඛණ්ඩතාවය තිබිය යුතු බවට ප්‍රකාශ කලද, අඛණ්ඩතාවය යන්න කුමක්ද යන්න මෙම චක්‍රලේඛනයේ හෝ රටේ පවතින වෙනත් නීතියක අර්ථකථනයක් තිබෙන බව වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාවට දන්වා නොමැත.

රටේ පවතින සාමාන්‍ය නීතිය තුළ බදු ඔප්පුවට පාර්ශවකරු විසින් බදු දේපලෙහි භුක්තිය භාර දුන් දිනය සහ භුක්තිය භාර ගත් බවට සඳහන් වූ දිනය ඔප්පු ලිවීමේදී භුක්තිය ආරම්භ කල දිනය ලෙස සලකනු ලැබේ. එසේ ක්‍රමවේදයට පටහැනිව වගඋත්තරකාර පාර්ශවය, නොතාරිස්වරයා විසින් සඳහන් කරන ලද දිනය බදු කාලය ආරම්භ කරන දිනය බවට ප්‍රකාශ කරන්නේ නම් එම ප්‍රකාශය නීත්‍යාණුකූල ප්‍රකාශයක් බවට ඔප්පු කිරීමට රට තුළ පිළිගන්නා ලිඛිත නීතියක් කොමිෂන් සභාවට පෙන්නුම් කළ යුතුය. කෙසේ වෙතත් වගඋත්තරකාර පාර්ශවකරුවන් පරීක්ෂණයේදී හෝ වාර්තාවක් මගින් ද එවැනි නීතියක් තිබෙන බවට කොමිෂන් සභාවට පෙන්වා දී නොමැත. එබැවින් වගඋත්තරකරු විසින් වාචිකව පවසා සිටින මෙම කාරණාව මෙවැනි අවස්ථාවකදී තීරණයක් ගැනීමට තරම් පිළිගත නොහැකි බව කොමිෂන් සභාවේ මතය වේ.

පෙත්සම්කරු විසින් ලබා දී තිබූ බදු ඔප්පුවට ලබාදිය යුතු ලකුණු 08කින් ලකුණු 02ක් පමණක් ලබා දීම නිවැරදි නොවන බවත්, ඔහුට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා මණ්ඩලය විසින් අහිමි කරන ලද ලකුණු 06 ලබාදිය යුතු බවත්, එකී ලකුණු 06 ලබා දී තිබුණේ නම් පැමිණිලිකරුගේ දරුවා වන එස්. ජේ. ටී. එම්. ගුණරත්න කොළඹ ආනන්ද විද්‍යාලයේ 2020 පළමු වන ශ්‍රේණියට ඇතුලත් වීමට බලාපොරොත්තු වූ ලකුණු 75ක් පහසුවෙන් ලබා ගැනීමට ඉඩ තිබූ බව දන්වා සිටිමි.

**නිගමනය :-**

මෙම සමස්ථ කරුණු අනුව, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) වගන්තියේ සඳහන් නීතිය ඉදිරියේ සමානත්වයෙන් සැලකීමේ අයිතිය වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

එබැවින්, පෙත්සම්කරුගේ දරුවාව නියමිත ශ්‍රේණියට ඇතුලත් කිරීමට කටයුතු කල යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.12.31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධ පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.**

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

**ම/.හේ. නිමල් කරුණාසිරි.**
**කොමසාරිස්.**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.**

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- **ලේකම්,**
**අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.**

ඩ/-